## ගල්ගමුව ප්‍රාදේශීය සභාව

### ප්‍රාථමික ශිල්පීය හා ශිල්පීය නොවන සේවක ගණයේ III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීම

වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා මෙම නිවේදනයේ සඳහන් සුදුසුකම් ඇති ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දැනටමත් සේවයේ නියුතු ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා සේවකයින් ගැන වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන / වෘත්තිය සුදුසුකම්* |
|---|---|---|---|---|
| 02. | රියැදුරු | 02 | (රා.ප.ච. 3/2016) PL-3-3/2016 රු. 25,790-10x 270 - 10 x 300 - 10 x 330-12x350- රු.38,990/= | 1. අ.පො.ස (සා.පෙළ) විභාගයේ දී දෙවරකට නොවැඩි වාර ගණනක දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකට සම්මාන සහිතව විෂයයන් 06 ක් වත් සමත් වී තිබිය යුතුයි. (වෛකල්පිත විෂයයන් හැර)<br><br>2. දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ අදාළ ආයතනයක ස්ථිර තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් රජයේ අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබීම ප්‍රමාණවත් වේ. |

| අනු. අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් ක්‍රමය | අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් |
|---|---|---|---|---|
| | | | | 3. තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ කොමසාරිස්වරයා විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි.<br><br>4. වාහන රියැදුරෙකු වශයෙන් වසර 02 ක පළපුරුද්දක් තිබිය යුතුයි. (සේවා සහතික මගින් සනාථ කළ යුතු වේ.) |

02. *අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

1. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය,
2. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනයට පූර්වාසන්න වසර තුනක් ගල්ගමුව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුයි. (පදිංචිය වසමේ ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරනු ලබන සහතිකයක් මත අදළ ප්‍රාදේශීය ලේකම් විසින් අනු අත්සන් කර සනාථකර තිබිය යුතුයි.),
3. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවු: 18 ට නොඅඩු හා අවු: 45 ට නොවැඩි විය යුතුයි. (දැනට පළාත් සභා රාජ්‍ය සේවයේ ස්ථිර, අනියම්, තාවකාලික, ආදේශක, ස්වේච්ඡා තනතුරක සේවයේ නියුතු අයදුම්කරුවන් සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව අදළ නොවේ.),
4. යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයෙන් විය යුතුයි,
5. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ රජයේ/පළාත් පාලන හෝ සංස්ථා සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතුයි.

03. *බඳවා ගැනීමේ ක්‍රමය :-*

1. සේවා අවශ්‍යතාවයට අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණ සහ ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ,
2. දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ ස්ථිර/තාවකාලික/අනියම්/ආදේශක/දීමනා/ස්වේච්ඡා පදනම මත සේවයේ නියුතු අයදුම්කරුවන්ට වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ,
3. නියමිත සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ට පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවීම් කරනු ලැබේ,
4. සුදුස්සන් තෝරා ගැනීම පිළිබඳව ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ ලේකම්ගේ තීරණය අවසාන තීරණය වේ.

04. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

1. සියලුම නතතුරු ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය,
2. අදළ පරිදි වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දයක විය යුතු ය,
3. බඳවා ගනු ලබන තැනැත්තන් වසර 03 ක පරිවාස කාලයකට යටත් වන අතර, ශ්‍රේණිගත උසස්වීමක් නම් එක් අවුරුදු වැඩ බැලීමේ කාලයකට යටත් වේ,
4. රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරනු සඳහාත්, විශේෂයෙන්ම රාජ්‍ය භාෂා පනතේ විධිවිධාන ක්‍රියාත්මක කරනු සඳහාත්, දැනටමත් සම්පාදනය කොට ඇති හා මින් මතු සම්පාදනය කළ හැකි විධිවිධානයන්ට එකඟව ක්‍රියා කළ යුතු ය,
5. මෙම බඳවා ගැනීමේ කොන්දේසිවලට අමතරව වයඹ ගරු ආණ්ඩුකාරතුමා අනුමත කර ඇති සේවා ව්‍යවස්ථාවේ කොන්දේසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද, වයඹ පළාත් සභාවේ හෝ වයඹ පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට ඉල්ලුම්කරු බැඳී සිටී.

05. *අයදුම්පත් ඉදිරිපත් කිරීම. :-*

1. අයදුම්කරුවන් මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රයට අනුව පිළියෙල කරන ලද අයදුම්පත් 2017.09.25 වැනි දින හෝ ඊට ප්‍රථම "ලේකම්, ගල්ගමුව ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි.

2. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ, තනතුර සඳහන් කර අයදුම්පත එවිය යුතුයි.

3. අයදුම්පත සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතුයි.

(i). උප්පැන්න සහතිකය,
(ii). අධ්‍යාපන සහතික,
(iii). තම පදිංචිය තහවුරු කිරීම පිණිස ප්‍රාදේශීය ලේකම්වරයාගේ සහතිකය,
(iv). මෑතක දී ලබාගත් චරිත සහතික දෙකක් (එකක් ග්‍රාම නිළධාරීගෙන් ලබාගත් එකක් විය යුතුයි.),
(v). වෘත්තීය පළපුරුද්ද පිළිබඳ සහතික. (රජයේ/පළාත් පාලන සේවයේ නියුක්ත වූවන් තම අයදුම්පත් දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියා මගින් ඉදිරිපත් කළ යුතුය.)

ඒ.බී. නිමල් රත්නායක,
ලේකම්,
ගල්ගමුව ප්‍රාදේශීය සභාව.

2017 ක් වූ අගෝස්තු මස 21 වැනි දින,
ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ දී ය.

**වයඹ පළාත් රාජ්‍ය සේවයේ ගල්ගමුව ප්‍රාදේශීය සභාවේ රියදුරු තනතුර සඳහා අයදුම්පත්‍රය**

01. (i) අයදුම්කරුගේ මුලකුරු සමග නම :————————
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම :————————
02. ස්ථිර ලිපිනය :————————
03. (i) උපන් දිනය : අවුරුද්ද :———— මාසය:———— දිනය :————
(ii) 2017.09.25 වැනි දිනට වයස :
අවුරුදු:———— මාස :———— දින:————
04. ජාතික හැඳුනුම්පත් අංකය :————————
05. දුරකතන අංකය:————————
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————————
07. විවාහක/අවිවාහක බව :————————
08. ජාතිය :————————
09. වයඹ පළාත තුළ ස්ථිර පදිංචි කාලය :————————
10. ඔබ ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද යන වග:————————
11. අධ්‍යාපන සුදුසුකම් (සමත් වූ විභාග පිළිබඳ විස්තර)

(i) සමත් වූ වසර/ශ්‍රේණිය :———— වර්ෂය :————
(ii) අ.පො.ස. (සා.පෙළ) විභාගය :————

විභාග අංකය :———— වර්ෂය :————

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| | | | |
| | | | |
| | | | |
| | | | |

(iii) අ.පො.ස. (උ.පෙළ) විභාගය :————
විභාග අංකය :———— වර්ෂය :————

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| | |
| | |
| | |
| | |

12. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :

13. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් එම සේවා කාලය සහ විස්තර :

14. ඔබ කවරදක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?:

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය හා නිවැරදි ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා එම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

.

අයදුම්කරුගේ අත්සන

දිනය :

*දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය.*
*(දැනට සේවයේ නියුක්ත වූවන්ට පමණි.)*

අයදුම්කරු ඉහතින් දක්වා ඇති තොරතුරු නිවැරදි බවත්, තෝරාගනු ලැබුවහොත් සේවයෙන් මුදාහැරීමට එකඟ වන බවත් දැනට..........................වශයෙන් සේවය කරන බවත් සහතික කරමි.

.

දෙපාර්තමේන්තු/ආයතන ප්‍රධානියාගේ අත්සන.
(නිල මුද්‍රාව තැබිය යුතුයි.)

දිනය :